# නපුරු කුඩම්මා




ආර්.බී. විශ්මි ආකර්ශා

# නපුරු කුඩම්මා

## ආර්.බී. විශ්මි ආකර්ශා

## මහ/ මහමායා බාලිකා විද්‍යාලය

3 ශ්‍රේණිය E

## කතාව සහ චිත්‍ර

## ආර්.බී. විශ්මි ආකර්ශා

**ISBN 978-624-208-255-4**

කෘතිය පළ කරන දින

2025.02.08

කතෘගේ වෙනත් කෘති

උත්සහවන්ත යහළුවෝ

**කතෘ ප්‍රකාශනයකි**

2025

# පිදුම

සිප් සතර කියා දුන්

මානෙල් වික්‍රමනායක

ගුරුතුමියටත්

සියලුම ගුරු මෑණිවරුන්ටත්

ගුරු පියවරුන්ටත්

දෙමාපියන්ටත්

මාගේ යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම ග්‍රන්ථය

පුද කරමි

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භිකෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක ගම්මානයක ගැහැනු දරුවකු ඇයගේ කුඩම්මා සමඟ ජීවත් වුණා. ඒ ගැහැනු දරුවාට කවුරුත් කතා කලේ නෙළුම් කියලා . ඇය පන්සල ළඟ ඇති කුඩා පැලේ නෙළුම් මල් විකුණුවා. ඒ නිසා ඇයට නෙළුම් කියා කවුරුත් කතා කළා.



ඇයට දිගු වරලසකුත් ලස්සන රූප සම්පත්තියකුත් තිබුණා.



ඇය සෑම දිනකම උදෑසනට හා සවස් යාමයට නෙළුම් මල් විකුණා අවසන් වූ පසු පන්සලට ගොස් බුදුන් වැඳීමට පුරුදු වී සිටියා.



ඇයගේ කුඩම්මා නපුරු තැනැත්තියකි .ඇය නෙළුම් මල් වෙළඳාම් කළ මුදල් කුඩම්මාට දිය යුතුය.



කුඩම්මේ මට ගොඩක් බඩගිනියි. අද මොනවද කන්න තියෙන්නේ අද මට කෑමට මොකුත් හදන්න බැරි වුණා . හොඳයි කුඩම්මේ මම අද කෑම හදන්නම් කුඩම්මටත් එක්ක නෙළුම් කිව්වා.



කපටි කුඩම්මා බොරු අසනීපයක් ගෙන නිදා ගත්තා. නෙළුම් කෑම උයා කුඩම්මාට ද බත් බෙදා දුන්නා.



නෙළුම් ගොඩක් හොඳ ගතිගුණ ඇති අවංක කෙනෙකි. ඇයට කුඩම්මාගේ කපටිකම් වැටහුණා. ඇය ඒ ගැන ගොඩක් දුකට පත් වුණා.



නෙළුම් ට අම්මයි,තාත්තයි නැති අඩුව හැම වේලාවකම දැනුණා. ඇය කුඩා අවදියේම ඇයගේ මව මිය ගියා.ඇයව බලා ගැනීමට පියා තව මවක් නිවසට ගෙනාවා.

ටික කාලයක් ගත වෙද්දී නෙළුම් ගේ පියා අසනීපවී මිය ගියා.ඊට පසු කුඩම්මා නෙළුම් ගේ දේපල සියල්ල අයිති කර ගත්තා .

දිනක් නිවස අසල තිබූ ළිඳට දිය ගෙන ඒමට කුඩම්මා ගිය විට ඇයට නයෙක් දෂ්ට කර මිය ගියා.



කුඩම්මාගේ මරණයත් සමඟ නෙළුම් ගොඩක් දුකට පත් වුණා.ඊටපසු ඇයගේ දේපල සියල්ල ඇයට හිමිවුණා. ඇය නෙළුම් මල් විකුණා ඉතා සතුටින් කාලය ගත කළා



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව  නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

ISBN 978-624-208-255-4